# හම්බන්තොට ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය.

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 දෙසැම්බර් 20 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 13 උනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 ගණුදෙනු , මෙහෙයුම් හා කාර්යසාධනය පිළිබඳ අදහස් දැක්වීම්.

1.2.1 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්.</u>

2011 දෙසැම්බර් 31 දිනට විගණන විමසුම් 36 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කල හැකි ගනුදෙනුවල වටිනාකම රු.28,033,371 ක් විය.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 1,415,277 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 ආදායම් පරිපාලනය.

2.1.1 කඩ කුලී.

සභාවට අයත් බැල්ලගස්වැව කඩ කාමර 12 කින් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලී මුදල රු. 598,029 ක් වූ අතර එම හිඟ කුලී අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.1.2 පොළ බදු.

නව මයුරපුර සති පොළෙහි 2011 වසර සඳහා බදු එකතු කිරීමේ අයිතිය ලබාගත් බදුකරු විසින් 2011 පෙබරවාරි 07 දින සිට පෙබරවාරි 28 දින දක්වා පොළ පැවැත්වූ දින 07 ක් සඳහා බදු මුදල් ගෙවීම පැහැර

හැර තිබුණි. හිඟ මුදල වු රු. 47,750 ක් අයකර ගැනීමට සභාව විසින් 2012 පෙබරවාරි 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

2.1.3 බලපත්‍ර ගාස්තු.
---------------

2011 වර්ෂයට අදාල බලපත්‍ර ගාස්තු නිසි පරිදි අයවී නොතිබු වෙළඳ ස්ථාන 46 කින් 2011 දෙසැම්බර් 31 දිනට රු. 223,150 ක මුදලක් අයවිය යුතුව තිබුණි. මෙම හිඟ බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (4) (ආ) හා 152 (4) වගන්ති ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.1.4 අක්කර බදු.
-------------

2011 දෙසැම්බර් 31 දිනට රු. 7,156 ක අක්කර බදු මුදලක් අයවීමට තිබුණු අතර ඉන් රු. 4,278 ක් ඉකුත් වර්ෂ සඳහා අයවීමට ඇති හිඟ අක්කර බදු මුදල් විය. හිඟ අක්කර බදු ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 (I) (ආ) අනුව කටයුතු කර නොතිබුණි.

2.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු.
----------------------------------------------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තියෙහි සඳහන් විධි විධානයන්ට පටහැනිව අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය රහිතව එකතුව රු. 38,106 ක මුදලක් සංග්‍රහ සඳහා වැයකර තිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 14(1) අනුව වාර්ෂික අයවැය ප්‍රතිපාදන සීමාව තුල වියදම් දැරිය යුතු අතර එම ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම් ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා සභා සම්මතයක් ලබාගත යුතු වුවත් , එසේ පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර ගැනීමකින් තොරව 2011 වර්ෂයේ වර්ෂික අයවැය ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු. 8,980,790 ක වියදම් දරා තිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු
---------------------
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු. 2,853,012 ක් වූ මිලදී ගැනීම් 09 ක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටු තීරණ ගෙන නොතිබුණු අතර එකතුව රු. 2,136,349 ක් වූ මිලදී ගැනීම් 05 ක් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබාගෙන නොතිබුණි.

(ආ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 ජුනි 16 දිනැති අංක 2007/03 දරණ අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාර නිවාඩු දින රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා සහකාර පළාත්

පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා නොගෙන කාර්මික නිලධාරීන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 97,610 ක නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඇ) 2007 අගෝස්තු 24 දිනැති අංක 06/2006 (iv) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ජේදයට අනුව දිනකට ගෙවිය හැකි සංයුක්ත දීමනාව රු. 350 ක් වුවද, දිනකට රු. 400 බැගින් ගෙවීම නිසා කාර්මික නිලධාරීවරයාට එකතුව රු. 9,200 ක සංයුක්ත දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 2006 නොවැම්බර් 28 දිනැති අංක දපපා/පරිනි/02/07 දරණ ලිපිය අනුව මහජන සම්බන්ධතා නිලධාරි තනතුරු සඳහා මසකට රු. 4,500 ක දීමනාවක් පමණක් ගෙවිය යුතු වුවත් , මසකට රු. 5,175 ක දීමනාවක් ගෙවා තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

(අ) 2011 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ එකතුව රු. 2,255,344 ක කල් පසු වූ තැන්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 3 කට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේද දීර්ඝ ප්‍රමාදයක් විය.

(ඇ) බඳගිරිය සතිපොළ භූමිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය අනුමත සමිතියක් වෙත පවරා ඉටුකරවා ගෙන 2011 ජූලි 12 දින රු. 373,567 ක මුදලක් ගෙවා තිබුණි. සතිපොළ පැවැත්වීම සඳහා අවශ්‍ය සියලුම පහසුකම් සකස් කර අවසන් වී තිබුණද, 2012 පෙබරවාරි 16 දින වන විටත් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාකර නොතිබුණි

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු. 93,208 ක් විය.

(ඉ) ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබාදීමෙන් පසුව සැලසුමට අනුව ඉදිකිරීම් සිදුකර ඇති බවට ක්ෂේත්‍ර පරීක්ෂාවකින් සනාථ කර අනුකූලතා සහතික නිකුත් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.5 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

---------------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

-------------------------

ආයතනයට අදාලව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන.
------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමණාකරණය

(ඇ) වාහන පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය